# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 68 — 1973 ජූලි 13 වැනි සිකුරාදා — 1973.07.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# II වැනි කොටස—අධිකරණ



| | පිට | | පිට |
|---|---|---|---|
| පනත් ... ... | (අතිරේක) | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 118 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 119 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා රට පහළ උසාවිවල දැන්වීම ... | 117 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | 121 |



සැළකිය යුතුයි.—(i) බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම් පත 1973 ජූනි 29 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදි,(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත 1973 ජූලි 13 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලවේ, (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

## දිස්ත්‍රික් උසාවිවල හා රට පහල උසාවිවල දැන්වීම්

අකය : මළපා 17/71

**පානදුර මහෙස්ත්‍රාත් උසාවියේ පරණ නඩු පොත් විනාශ කිරීම**

පහත උප ලේඛනයේ සඳහන් කර ඇති පානදුර මහෙස්ත්‍රාත් උසාවියේ නඩු පොත් අද දින සිට මාස තුනකින් පසු ප්‍රඥප්ති නීති සංග්‍රහයේ (1956) ප්‍රති ශෝධිත සංස්කරණයේ 479 වැනි පරිච්ඡේද යේ විධිවිධානයන්ට යටත්ව විනාශ කරන බැව් මෙයින් දැනුම් දෙමි.

යම් නඩු පොතක් විනාශ නොකළ යුතු බවට උනන්දුවක් දක්වන කෙනෙක් වෙතොත් ඔහු විසින් පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු මගින් හෝ පෙත්සමක් මගින් හෝ කරුණු ඉදිරිපත් කළ යුතුය.

පු. බ. රඹුක්වැල්ල,
පානදුරේ මහෙස්ත්‍රාත්.

1973 මැයි මස 26 වෙනි දින,
පානදුර මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

උපලේඛණය

1957=43700—48599
48800—51099
1958=51100—54799
1959=54600—59299
1960=59300—60899

7-348—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**දැන්වීමයි**

මල්ලාකම් රික්වෙස්ට් උසාවිය

වටිනාකම් නොමැති ලියකියවිලි විනාශකර දැමීමේ ආඥා පනත (පරිච්ඡේදය 479) යටතේ ඇති රෙගුලාසි අනුව මෙම උසාවියේ 1942. 02. 10 සිට 1960. 12. 31 දක්වා (එනම් නඩු අංක: 12503 සිට 15833) තබන ලද වටිනාකම් නොමැති සිවිල් නඩු පොත් (මුදල්) අද සිට මාස තුනක් ඇතුළත විනාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

මෙම නඩු පොත් වලින් නඩුවක් ගැන යම් කෙනෙකුට සම්බන්ධයක් ඇතොත් එසේ යම්කිසි නඩු පොතක් විනාශ නොකළ යුතු නම් ඉහත කී මාස 3 ක කාල සීමාව ඇතුළත ඒ බව තමාම නැත හොත් තමාගේ පෙරකදෝරු නැතහොත් තමාම පෙත්සමක් මගින් ද උසාවියට පිළිගත හැකි කරුණු ඉදිරිපත් කළ යුතුය.

ඇම්. ඩී. ජේසුරත්නම්,
මහේස්ත්‍රාත්, මල්ලාකම්.

1973. 06. 21 වැනි දින,
මල්ලාකම්, මහෙස්ත්‍රාත් උසාවියේ දී.

7-257/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයෙ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. ඩී. සිරිසේ,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවෙහි (ලංකා නීති ප්‍රඥප්ති 381 වෙනි අධිකාරයේ, 1956 සංශෝධිත කරන ලද පරිශෝධිත මුද්‍රණය).

1972 ඔක්තෝම්බර් මස 9 වෙනි දින පුත්තලම අංක. 96 දරණ මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා පවත්වන ලද මැතිවරණය.

පුත්තලම, කඩුම්යන්කුලම් පාරේ, මහරියෝ කරීෆා අබුසාහිබු ........................................ පෙත්සම්කරු.

1972 අංක. 1 දරණ
මැතිවරණ පෙත්සම                එදිරිව

(1) මොහමඩ් හනීෆා මහමදු නයිනා මරික්කාර්, "හනීෆා විලා", උතුරු පාර, පුත්තලම. (2) කඩුපිටිගේ තේගිස් සිල්වා නොහොත් කඩුපිටිගේ ජුවන් සිල්වා නොහොත් විදානේ, නාවඩන්කුලම් හන්දිය, මුන්දල් තැපැල්. (3) අසන් කුද්දුස් අහමඩ්, අංක. 9 පටුමග, කන්කානිකුලම් වීදිය, පුත්තලම. (4) වර්ණකුලසූරිය ජෙරමියස් ප්‍රනාන්දු, ධීවර කාර්යාලය, මංගලඑළිය හන්දිය, මුන්දල් තැපැල්. (5) වර්ණකුලසූරිය වැලන්තීනු එඩ්මන්ඩ් ප්‍රනාන්දු, කන්දතොටුව, පුත්තලම. (6) මිහිඳුකුලසූරිය ජෝන් ප්‍රනාන්දු, කන්දතොටුව, පුත්තලම. (7) මිහිඳුකුලසූරිය බස්තියන් කුරේරා, කන්දතොටුව, පුත්තලම. (8) මිහිඳුකුලසූරිය සෙබස්තියන් පින්ටෝ, කිලවමඩච් චෙනායි, කඩයමොට්ටායි, මදුරන්කුලි තැපැල්. (9) ජයවීර ආරච්චිගේ දොන් සේදිරිස් රණසිංහ, නාවඩන්කුලම්, මුන්දල්. (10) වර්ණකුලසූරිය ප්‍රැන්සිස් ප්‍රනාන්දු නාවඩන්කුලම්, මුන්දල් (11) වර්ණකුලසූරිය වින්සන්ට් ප්‍රනාන්දු නොහොත් ජපන් වින්සන්ට්, නාවඩන්කුලම්, මුන්දල්. (12) ජයකොඩි ආරච්චිගේ දොන් මාටින් අප්පුහාමි, නාවඩන්කුලම්, මුන්දල් ........................................ උගඋත්තරකරුවන්.

ඉහත සඳහන් කරනු ලැබූ නීති කෘතියෙහි 6 වන වගඋත්තරකරු වූ පුත්තලමේ, කන්දතොටුවාවේ මිහිඳුකුලසූරිය ජෝන් ප්‍රනාන්දු මිය ගොස් ඇති බව, සංශෝධනය කරනු ලැබූ 381 වන අධිකාරය වූ ලංකා පාර්ලිමේන්තු රාජසභා ආඥාවෙහි තෙවන උපලේඛනයේ 29 වන රීතිය යටතේ සහ ඊට අනුකූලව මෙයින් දැන ගත යුතු අතර මෙයින් දන්වනු ලැබේ. තවද මේ පෙත්සමට අදාලවන්නා වූ මැතිවරණය පිළිබඳව පෙත්සම්කරුවකු විය හැකි යම් තැනැත්තෙක් මෙම දැන්වීම පළ කරනු ලැබීමෙන් පසු දස දිනක් ඇතුලත දී මේ පෙත්සමට විරෝධය දැක්වීම පිණිස වගඋත්තරකරුවකු වශයෙන් ඇතුලත් කර ගැනීම සඳහා මෙම අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි යයි තවදුරටත් මෙයින් දන්වනු ලැබේ.

ලෝරි වික්‍රමසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්.

1973 ජූනි මස 29 දින කොළඹ දී ය.

7-277—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.29 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.06 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.13 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.20 | සිකුරාද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.